# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ලංසු ආරාධනය

### ත්‍රිකුණාමලය දුම්රිය මාර්ගයට සහ මඩකලපුව දුම්රිය මාර්ගයට හස්තියව ක්‍රියා කරවන ගේට්ටු බාධක සැපයීම, ස්ථාපනය, පරීක්ෂාව සහ ක්‍රියාකරවීම සඳහා වන ප්‍රසම්පාදනය

**ශ්‍රී ලංකා දුම්රිය සේවය IFB No - SRS F.7998**

1. ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ත්‍රිකුණාමලය දුම්රිය මාර්ගයට සහ මඩකලපුව දුම්රිය මාර්ගයට හස්තීයව ක්‍රියා කරවන ගේට්ටු බාධක සැපයීම, ස්ථාපනය, පරීක්ෂාව සහ ක්‍රියාකරවීම සඳහා දේශීය නිෂ්පාදකයන්/සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

2 ලංසු කැඳවීම ජාතික **තරගකාරීත්ව ලංසු පටිපාටිය (NCB)** අනුව සිදු කෙරෙනු ඇත.

3 උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට **2024.03.14 සිට 2024.04.04** දක්වා සතියේ දිනවල වැඩ කරන දිනයන්හිදී **පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා** කාලය තුළ පහත දක්වා ඇති ලිපිනයෙන් **පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා** ලංසු ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි දුර තොරතුරු ලබා ගැනීමට හැකි ය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදනය),**
**දුම්රිය මාර්ගය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10,**
**ශ්‍රී ලංකාව.**

| | |
|---|---|
| **දුරකථන අංක** | **: + 94 (11) 2438078 හෝ + 94(11) 2436818** |
| **ෆැක්ස් අංකය** | **: + 94(11) 2432044** |
| **ඊ මේල්** | **: srs.slr@gmail.com** |
| **වෙබ් අඩවිය** | **: www.railway.gov.lk** |

4 පහත සුදුසුකම්වලින් එකක් හෝ කිහිපයක් සපුරමින් සමාන වර්ගයේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ පළපුරුද්ද ප්‍රදර්ශනය කළ යුතු ය.

අ. පසුගිය වසර 15 ක කාලය තුළ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත දුම්රිය හරස් මාර්ග ආරක්ෂක පද්ධතිය සපයා තිබීම.

ආ. ලංසුකරුවන් පසුගිය වසර 5 තුළ අවම වශයෙන් උද්ධෘත මිලට වඩා වැඩි අගයකට සමාන කොන්ත්‍රාත් අගයකට හෝ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත විදුලි/යාන්ත්‍රික උපකරණ/පද්ධති සපයා තිබීම.

ඇ. ලංසුකරුවන්ට පසුගිය වසර 5 තුළ අවම වශයෙන් උද්ධෘත මිලට වඩා වැඩි අගයකට සමාන කොන්ත්‍රාත් අගයකට හෝ ශ්‍රී ලංකා දුම්රිය සේවය තුළ සිවිල් ඉදිකිරීම් පළපුරුද්ද තිබීම.

ඈ. ලංසුකරුට වසර 5කට වැඩි කාලයක් ලෝහ නිෂ්පාදන සහ/හෝ ලෝහ නිෂ්පාදන ස්ථාපනය කිරීමේ පළපුරුද්ද ඇති අතර පසුගිය වසර 5 තුළ උද්ධෘත මිලට නොඅඩු වටිනාකමක් සඳහා ලෝහ නිෂ්පාදන ස්ථාපන ව්‍යාපෘතියක් සාර්ථකව සිදු කර තිබීම.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024.03.14 සිට 2024.04.04 දක්වා ප.ව.3.00** තෙක් **නැවත ගෙවනු නොලබන රු.26,000/-** ක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවා ලිඛිත අයදුම්පත්‍රයක් **ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය, ඕල්කොට් මාවත, කොළඹ 10** යන ලිපිනයට යොමු කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකිය

6. සියළු ම ලංසු සමග වටිනාකම **රු. 1,400,000.00ක්** වූ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කල ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවක් මගින් නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් ලෙසින් වූ, ලංසු ඇපකරය බැගින් තිබිය යුතු ය.

7. **2024.04.05 ප.ව.2.00 හෝ එදිනට පෙර** පහත ලිපිනයට ලංසු එවිය යුතු අතර ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. මෙම ලංසු විවෘත කිරීමේදී පෙනී සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කට් මාවත,**
**කොළඹ 10.**